# ප්‍රශංසා එකතු සුපුවත
## 2018 ජූනි මස 11 වන දින සිට 17 වන දින දක්වා
## පියාණන් වහන්සේගේ වචනයට ආදරය කළ සමිඳාණන් අනුව යමු

01. ආරම්භක ප්‍රශංසාව :
  පුබුදු ගී අංක 05 "ශ්‍රද්ධාන වීර්ය...."

02. ප්‍රශංසාවට හැඳින්වීම :
  "නිතරම ප්‍රීති වන්න; නොකඩවා යාච්ඤා කරන්න. සියල්ලේදී ස්තුති දෙන්න. ක්‍රිතුනුවන් වශයෙන් දෙවියන් වහන්සේ ඔබගෙන් බලාපොරොත්තු වන්නේ මෙය වේ." (1තෙසලෝනික 5:16-18) සියල්ලේදී ස්තුති දිය හැක්කේ, සියල්ලේදීම දෙවියන් වහන්සේගේ ආදරය අත්දකින අයටය. යහපතේදී ද, අයහපතේදී ද දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම දීමනාවකි. නොකඩවා යාච්ඤාවේ යෙදෙන්නා හට, නිරන්තරයෙන් ශුද්ධාත්මයාණන් වහන්සේට ඉඩ දෙන, අවදිවන තැනැත්තාට ප්‍රීතියෙන් යුතුව සියල්ලේදී ස්තුති ප්‍රශංසා කළ හැකිය. ඔබ / මම එවැනි ආශිර්වාදයක් ලත් පිබිදුනු ක්‍රිතුනුවන්ය. අප ලබා ඇති මහඟු වරප්‍රසාදය උදෙසා අද දවසේදී ප්‍රශංසා කරමු.
  පුබුදු ගී අංක 73 "ප්‍රීති වන්න සැමවිට...."

03. ආපසු බැලීම :
  i ශුද්ධාත්ම ගින්නෙන් ඇවිළුනු ඔබට ඒ ගින්නෙන් අන් අය අවුළුවන්නට පියවරක් ගත හැකි විද?
  ii හැම මොහොතකම ශුද්ධාත්ම ගින්නෙන් අප සැම අවුළුවන්නැයි යාච්ඤා කරන්නට ඔබ අවදි වූවාද?

04. දවසේ සුපුවත :
  වචනයට ආදරය කළ ජේසු සමිඳාණන් වහන්සේ දෙස අපගේ නෙත සිත හදවත යොමු කිරීමෙන්ම වචනයට ආදරය කිරීමේ පිපාසය, ආශාව අප තුළ ඇතිවන බව නොඅනුමානය. ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ උපතේ සිට මරණය දක්වාම පියාණන් වහන්සේගේ වචනයට කීකරු වීම, වචනය බාර ගැනිම, වචනයට ප්‍රතිචාර දැක්වීම අපට දැකගත හැකිය.

* සමිඳාණන් වහන්සේ දෙවියන් වහනසේගේ ඒකජාතක පුත්‍රයාණන් වුවද, මනුෂ්‍ය පුතෙකු ලෙස මෙලොවට පැමිණෙන්නට ලද වචනයට අවනත වූයේ මුළු විශ්වයම ගළවන්නට දෙවියන් වහන්සේ සැළසුම් කර තිබූ දේව සිතට ඉඩ දෙමිනි.
* දේව පුත්‍රයා ලෙස සියළු සැප සම්පත්, සුව පහසුව විඳින්නට ඉඩ තිබියදී අන්ත දුගියෙකු ලෙස ගවහලක ඉපදෙන්නට දෙවියන් වහ්නසේ සැළසුම් කිරීම තුළ, මව් කුසයේදීම වචනයට කීකරු වුනු අත්දැකීම, අප සමිඳාණන් වහන්සේ වචනයට ආදරය කිරීමට පටන් ගැනීමක් ලෙස අපට සැළකිය හැකිය.
* සමිඳුන් පුද දෙන්නට දේව මාළිගාවට ගිය මොහොතේ සිමියොන් දිවස්ප්‍රසාදි වරයා ප්‍රකාශ කළ වචනය බිළිඳු ජේසු සමිඳුන්ගේ හදවත තුළ දේව කැමැත්ත සිදුවීමේ වචනයක් ලෙස ස්ථාපිත වන්නට ඇත.
* අවුරුදු 12දී දේව මාළිගාව තුළ පඬිවරයන් අතර උගතෙකු ලෙස කතා කරන මොහොතේදී දෙවියන් වහ්නසේගේ පුතා ලෙස ක්‍රියා කළයුතු බවට දේව හඬ ඔවුන් වහන්සේට ඇසෙන්නට ඇති. ඒ වචනයට ආදරය කළ සමිඳාණෝ මනුෂ්‍ය සම්බන්ධකම් අභිබවා දේව කැමැත්ත මත ක්‍රියා කළ සේක.
* පව්කරුවන් ස්නාපනය කරන ජෝර්දාන් ගඟට බසින්නට දේව හඬ ක්‍රිස්තුන් වහන්සේ තුළ පිපාසයක් ඇති කරවීය. එම ස්නාපනය තුළ දෙවියන් වහන්සේගේ හඬ 'මේ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය; මම ඔබ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි' යන වචනය අයිති කරගත් සමිඳාණෝ සිය දූත කාර්යය ඇරඹූයේ වචනයට ආදරය කිරීමේ ප්‍රතිඵලයක් ලෙසය.
* දුක්විඳින්නට, පීඩාවන්ට මුහුණ දෙන්නට, ප්‍රතික්ෂේපයන්ට ලක්වෙන්නට, අන්ධකාරයේ පැයවල් පසු කරන්නට සිදුවීමේදී ද දේව හඬට සවන් දෙන්නට, වචනයට කීකරු වෙන්නට ක්‍රිස්තුන් වහන්සේ තුළ තිබුනාවූ පුදුමාකාර නිදහස වචනයට ආදරය කිරීමේ මහා බලයයි.
* කුරුසියේ මරණය ඔවුන් වහන්සේගේ ජීවිතයේ අවසාන ඉරණම බව දැනසිටි සමිඳාණන් වහන්සේ ඊට නිදහසින් යුතුව අවනත වූයේ වචනයට ආදරය කළ නිසාය.

  දෙවියන් වහන්සේගේ වචනයට කීකරු වෙන අයට, ඔවුන් වහන්සේගේ කැමැත්තට අවනත වෙන අයට ආශිර්වාදය බහුල ලෙස ගලා එයි. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ ඔවුන් වහන්සේ අත්දුටු ආශිර්වාදය උත්ථානයයි. මරණයට කීකරුවුනු ඔවුන් වහන්සේ උත්ථානයේ

ආශිර්වාදය ලැබූ සේක. ඔවුන් වහන්සේ අනුව යන්නට කැඳවීමක් ලත් අප තුළ දේව වචනයට ආදරය කරන්නට, ඒ තුළ ජීවත් වෙමින් ආශිර්වාද ලබන්නට කැඳවීමක් ලැබී ඇත.

04. සාකච්ඡාව සඳහා :

* පසුගිය වසරේ ශුද්ධාත්ම මංගල මහෝත්සවයේ තේමා දේශනය හරහා වචන කීපයක්ම අපට අනාවරණය කළා. ඉන් එක් වචනයක් තමයි ජුසේ වාස් මෙහෙවර.

i මේ වචනයට ආදරය කරන්නට ඔබට හැකි වුනාද?

ii ඒ සඳහා ඔබ ගත් පියවරයන් මොනවාද?

iii 2018 ශුද්ධාත්ම මංගල රාත්‍රියේදී එහි ප්‍රතිඵල නෙලා ගන්නට, ආශිර්වාදය ලබන්නට ඔබට හැකිවීද?

05. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 137 "ඔබගේ වචනයේ දාසියයි මා ...."

========================

## ප්‍රශංසා එකතු සුපුවත

### 2018 ජුනි මස 18 වන දින සිට 24 වන දින දක්වා

### දේව කැමැත්ත සම්පූර්ණයෙන් ඉටුවන තැන ස්වර්ගයයි

01. ආරම්භක ප්‍රශංසාව :

පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ..."

02. ප්‍රශංසාවට හැඳින්වීම :

දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීම ආනන්ද ජනක අත්දැකීමකි. ප්‍රීතිය, සාමය, නිදහස, ගැලවීම, විමුක්තිය අත්දැකිය හැකි මොහොතකි. දේව කැමැත්ත ඉටු වන තැන ස්වර්ගය අත්දකින්නට හැකිය. මේ මොහොත ප්‍රශංසාවේ බලය නික්මෙන මොහොතයි. ස්වර්ගය අත්දැකිය හැකි මොහොතයි. ස්වර්ගීය සේනාව සමඟ එක්ව අපි ප්‍රශංසාවට ඇතුළු වෙමු. පුබුදු ගී අංක 135 "සකල මැවිල්ලට...."

03. ආපසු බැලීම :

i දෙවියන් වහන්සේගේ වචනයට ආදරය කළ සමිඳාණන් දෙස වශී වී ඉන්නට ඔබට හැකිවීද?

ii දෙවියන් වහන්සේගේ ඔබ ලද වචනයට ආදරය කරන්නට, එය භාර ගන්නට පසුගිය සතිය තුළ ඔබට හැකි වීද?

04. දවසේ සුපුවත : **දේව කැමැත්ත සම්පූර්ණයෙන් ඉටුවන තැන ස්වර්ගයයි**

* දේව කැමැත්ත යනු දේව රාජ්‍යයයි.

* දේව රාජ්‍යය යනු දෙවියන් වහන්සේගේ පාලනය සිදුවන තැනයි.

* දේව පාලනයට නතුවන, දේව කැමැත්ත ඉටුවන තැන දේව රාජ්‍යයයි. එය එසේ නම් සමිඳාණන් වහන්සේගේ මුළු ජීවිතයම දේව පාලනයට නතු වූ දේව කැමැත්ත පමණක් සිදුවූ ජීවිතයකි. එම නිසා ජේසු සමිඳාණන් වහන්සේ හට ස්වර්ගය විවර විය.

* ජේසු සමිඳාණන් වහන්සේ, තමන් වහන්සේ හට පැවරුනු දූත කාර්යය ආරම්භ කරන්නේ ජොර්දාන් නදියේ බෞතිස්ම ස්නාපනය ලබමිනි.

* අප වගේම, පව්කාර මිනිසුන්ගේ තැන ගනිමින් සාමාන්‍ය මිනිසෙකු ලෙස තම දූත කාර්යය අරඹමින් පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කරන්නට බාර ගත් සමිඳාණන් වහන්සේට ලැබෙන ත්‍යාගය දේව පුත්‍රභාවයේ ආශිර්වාදයයි.
"ඔවුන් වහන්සේ දියෙන් ගොඩනැගෙත්ම ස්වර්ගය විවර වී, ආත්මයාණන් වහන්සේ පරවියෙකු මෙන්, තමන් පිට බැස එනු දුටු සේක. තවද ස්වර්ගයෙටන් නික්මුනු හඬක් 'ඔබ මාගේ ප්‍රියාදර පුත්‍රයාණෝය; ඔබ කෙරේ ඉතා ප්‍රසන්න වී සිටිමි'යි පැවසීය."

* ජොර්දාන් නදියේදී ලද බෞතිස්ම ස්නාපනය ජේසු සමිඳාණන් මුළු ජීවිතය තුළම දේව කැමැත්ත ඉටු කරන්නට ලද ආලේපයයි. මරණයේ හා උත්ථානයේ සෙවනැල්ලක් ලෙස එය අපට දැකිය හැකිය.

* පරමණ්ඩල යාච්ඤාව තුළ ක්‍රිස්තුන් වහන්සේ අපට උගන්වනවා ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද ඔබගේ කැමැත්ත ඉටු වේවා කියලා යාච්ඤා කරන්නට. සෑම තැනම දේව

කැමැත්ත ඉටුවිය යුතු බව ඔවුන් වහන්සේගේ පිපාසයයි. දේව කැමැත්ත සම්පූර්ණයෙන් ඉටුවන තැන ස්වර්ගය බව ඔවුන් වහන්සේගේ අත්දැකීමයි.

* දේව කැමැත්ත ඉටු කිරීම පහසු කාර්යයයක් නොවේ. ස්වර්ගය දිනා ගැනීම ලෙහෙසි කාර්යයක් නොවේ. ජේසු සමිඳාණන් වහන්සේට ස්වර්ගය විවර වුනේ පව්කරුවන් වාගේ, පව්කරුවන්ගේ පාපය කරට ගෙන ජෝර්දාන් නදියට බසින්නට කැමති වූ නිසයි. ජෝර්දාන් නදියේ පතුලටම බැස්ස මොහොතේ ඔවුන් වහන්සේට ස්වර්ගය විවර වුනා.
* ප්‍රසන්න පුත්‍රභාවය අයිති කරගත් සමිඳාණන් වහන්සේ තම දූත කාර්යය අවසාන මොහොත දක්වාම, කුරුසිය මත සිය හුස්ම හෙලන මොහොත දක්වාම දේව කැමැත්ත පූර්ණව ඉටු කළා. දේව කැමැත්ත පූර්ණව ඉටුවන තැන විවර වන ස්වර්ගය අත්දැක්කා. ඒ නිසා ඔවුන් වහන්සේ සමඟ කුරුසියේ ඇණ ගසා සිටි සොරාට කියන්නේ 'අද ඔබත් මා සමඟ පාරාදීසයේ සිටිනු ඇත' කියා.

05. අප දෙස : (සාකච්ඡාව සඳහා)

i ඔබට / මට ලැබී ඇති කැඳවීම ද ස්වර්ගීය ජීවිතයක් ගත කිරීමේ කැඳවීමකි. ස්වර්ගය විවර වන්නේ සම්පූර්ණයෙන්ම දේව කැමැත්ත ඉටුවන තැනයි. අප ජීවිත තුළ දේව කැමැත්තට තිබෙන ඉඩ කොතෙක්ද?

ii මගේ පවුල, සංඝය, ප්‍රශංසා එකතුව දේව කැමැත්ත ඉටුවන තැනක්ද?

iii ඔබ / මම ඔවුන් වහන්සේගේ ප්‍රසන්න පුත්‍රභාවය අත්දකින අයද?

06. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරව...."

==================

**ප්‍රශංසා එකතු සුපුවත**

**2018 ජූනි මස 25 වන දින සිට 30 වන දින දක්වා**

**ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදියෙන් සිට යාච්ඤා කරන්න**

01. ආරම්භක ප්‍රශංසාව :

පුබුදු ගී අංක 07 "සුදත් සුරිඳුනේ ....."

02. ප්‍රශංසාවට හැඳින්වීම :

අපි මෙම ක්‍රිස්තුන් වහන්සේ තුළින් තෝරා ගත් කෙනෙක් වෙමු. එසේ වන්නේ දෙවියන් වහන්සේ පෙර නියම කරගත් සැලැස්ම ලෙස, සියල්ල සිදු කරන ස්වකීය අභිප්‍රාය අනුවය. එබැවින් ක්‍රිස්තුන් වහන්සේ තුළින් ප්‍රථමයෙන් බලාපොරොත්තු ලැබූ අප, ඔවුන් වහන්සේගේ මහිමය සඳහා ප්‍රශංසා කළ යුතුය. (එපීස 1:11-12) පිබිදුනු ක්‍රිස්තියානි කාරයෙකු ලෙස සාක්ෂි දැරීමේ ජීවිතයක් ගත කිරීමට කැඳවීම ලත් අපි, සියල්ලෙහිදී මහෝත්තම දෙවි සමිඳාණන් පසසමු. ඔවුන් වහන්සේට ස්තුති කරමු.

පුබුදු ගී අංක 95 "ඔබ තෝරා ගත්...."

03. දවසේ සුපුවත :

'ඔබ පරීක්ෂාවට නොවැටෙන පිණිස අවදියෙන් සිට යාච්ඤා කරන්නැ'යි අප සමිඳාණන් පවසනුයේ, සිය අත්දැකීමෙන්මය. ජේසු සමිඳාණන් වහන්සේ දේව පුත්‍රයාණන් වුවද, සැබෑ මනුෂ්‍යයෙකු ලෙස මෙලොව තම දූත කාර්යය ඉටු කිරීමේදී මුහුණ දුන් සියල්ල තුළ යක්ෂයා, ලෝකයා, මාංශයගෙන් එල්ල වූ සියලු අභියෝගයන්ට මුහුණ දුන්නේ යාච්ඤාවෙන් යුතුවය.

* ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළද දේව කැමැත්තෙන් ඔවුන් වහන්සේව ඈත් කරන්නට නපුරා බොහෝ සේ උත්සාහ දැරූහ. පේදුරු තුමා හරහාම යක්ෂයා ඔවුන් වහන්සේව පරීක්ෂා කරන්නට උත්සාහ කළාය. සමිඳාණන් වහන්සේ එය හඳුනා ගෙන, 'නුඹ සිතන්නේ මිනිසුන් සිතන විදියටයැ'යි පේදුරු තුමාට ප්‍රකාශ කරන සේක.
* අන්‍යරූප විලාශවීමේ සිද්ධියේදී පේදුරු තුමා කළ ප්‍රකාශය 'අයියෝ ස්වාමිනී, අපට හැමදාම මෙහෙ ඉන්න පුලුවන් නම් කොච්චර වාසනාවක්ද? ' නැවත පේදුරු මිනිසුන් සිතන විදියට සිතන බව සමිඳාණන් වහන්සේට දැනෙනවා. මෙලෙස පේදුරු තුමා පිළිතුරු දෙනු ලැබුවේ ශුද්ධාත්මයාණන් වහන්සේව නොලැබීම නිසා බවද දකින සමිඳාණන් වහන්සේ පේදුරු තුමා තුළින් යක්ෂයා ඔවුන් වහන්සේවත් පරීක්ෂා කරන්නට උත්සාහ කරන බව අඳහා ගත් සේක.

* ශු.මතෙව් 26:38-39 කොටස තුළ ඔවුන් වහන්සේ තුන් සැරයක් මුනින් වැටී යාච්ඤා කරනවා. තුන් සැරේම කියනවා, "අහෝ මාගේ පියාණෙනි, හැකි නම් මේ කුසලානය මා කෙරෙන් පහ කළ මැනව" කියා. දේව කැමැත්ත නොකර ඉන්නට පෙළඹීමක් ඇති කරන යක්ෂයාට ඔවුන් වහන්සේ අවදිව සිටි සේක.
* ජේසුස් වහන්සේ වේදනාව වැඩි වෙන්න වැඩි වෙන්න යාච්ඤා කළ සේක. හෙබ්‍රෙව් ලිපියේ සඳහන් වන පරිදි ඔවුන් වහන්සේ බලවත් හැඬීමෙනුත් කඳුළු සැලීමෙන් යාච්ඤා ද, කන්නලව් ද ඔප්පු කළ සේක.
* අන්තිම භයංකාර පැයෙන්, තාත්තාගේ කැමැත්තෙන් තමන්ව ඉවත් කරන්න යක්ෂයා ඔවුන් වහන්සේව පරික්ෂා කරන ආකාරය සමිඳාණන් වහන්සේට පෙනුන සේක. මාක් තුමාගේ ප්‍රකාශනය තුළ 'ඔවුන් වහන්සේ අතිශයින් බියපත් වෙන්න පටන් ගත් සේක. ශෝක වෙන්න පටන් ගත් සේක' යනුවෙන් ද, ලූක් තුමාගේ ප්‍රකාශනය තුළ 'ඔවුන් වහන්සේ දැඩි සිත් වේදනාවෙන් පෙළුණු සේක' යනුවෙන් ද සඳහන් වේ.

මේ හැම මොහොතකම ඉතා ඕනෑකමින් යාච්ඤා කළ සමිඳාණන් වහන්සේ නපුරාව පරාජය කළ සේක. අවදිව සිට යාච්ඤා කරමින් දේව තාත්තාගේ කැමැත්ත පූර්ණව ඉටු කළසේක. තමන් වහන්සේට බාර දුන් දූත කාර්යය නිමාවට පත් කළ සේක.

තමන් වහන්සේට පරික්ෂාවට හසු නොවී ඉන්නට මෙතරම් අමාරු වූයේ නම් ශ්‍රාවකයන් හට එය කෙසේ දුෂ්කර වේදැයි සමිඳාණන් වහන්සේට දැනෙන්නට ඇති. ඒ නිසයි 'ඔබ පරික්ෂාවට නොවැටෙන පිණිස අවදියෙන් සිට යාච්ඤා කරන්නැ'යි පවසනුයේ.

04. අප දෙසට - (සාකච්ඡා කරන්න)

* එදා ශ්‍රාවකයන් සමිඳාණන් වහන්සේ බලාපොරොත්තු වූ ජීවිතය ගත කරන්නට අපොහොසත් වූයේ, ඔවුන්ගේ විශ්වාසයේ ජීවිතය හීන වූයේ ශුද්ධාත්මයාණන්ගෙන් ඔවුන් පිරී නොසිටි නිසාය. නමුත් ඔබ /මම ශුද්ධාත්ම ස්නාපනය ලැබූවන්ය. අද ඔබට/මට ඔවුන් වහන්සේ ද ආරාධනා කරනුයේ 'පරික්ෂාවට නොවැටෙන පිණිස අවදිව යාච්ඤා කරන්නට' කියාය. තවද උපවාසයෙන් හා මර්ධන ක්‍රියාවෙන් යාච්ඤා කිරීමෙන් අපට පරික්ෂාවට නොවැටී සිටීමට බලයක් ලැබෙනු ඇත.

i පරික්ෂාවට නොවැටී සිටින්නට අප අවදියෙන් සිටිනවාද?
ii අපව පරික්ෂාවට පමුණුවන නපුරාව හඳුනා ගන්නට අපට හැකිද?
iii ඒ සඳහා ගැඹුරු යාච්ඤාවේ ජීවිතයක් අප සතුද?

05. අවසාන ප්‍රශංසාව :
පුබුදු ගී අංක 97 "ජේසුගෙ නාමෙන් ...."

************************